සියලු ම හිමිකම් ඇවිරිණි. | රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

# 40 - සංගීතය (පෙරදිග)

## ලකුණු දීමේ පටිපාටිය




Department of Examinations - Sri Lanka

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020**

**<u>40 - සංගීතය (පෙරදිග)</u>**

## ලකුණු දීමේ පටිපාටිය

**I** පත්‍රයට - 1 × 40 = 40

**II** පත්‍රයට - පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුයි .

- එක් ප්‍රශ්නයකට ලකුණු 20 × 05 = 100

Department of Examinations - Sri Lanka


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ........................................ | √ | △ 4/5 |
| (ii) | ........................................ | √ | △ 3/5 |
| (iii) | ........................................ | √ | △ 3/5 |
| ( 03 ) | එකතුව | ➡ | □ 10/15 |

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.
II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.
III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**
IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.
V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**
VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

Department of Examinations - Sri Lanka


Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

**අ.පො.ස. ( සාමාන්‍ය පෙළ විභාගය - 2020 සංගීතය ( පෙරදිග )**
**එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු ප්‍රදානය කිරීම පිළිබඳ සාරාංශය.**

**සංගීතය ( පෙරදිග )** - i

මෙම ප්‍රශ්න පත්‍රයේ බහුවරණ ප්‍රශ්න 40 කි.

**සංගීතය ( පෙරදිග )** - ii

මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 07 කි. ඉන් පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ප්‍රශ්න 05 කට ලකුණු 100 කි.

1. ප්‍රශ්නය
   - 1.1. ලකුණු 02 යි.
   - 1.2. ලකුණු 02 යි.
   - 1.3. ලකුණු 02 යි.
   - 1.4. ලකුණු 02 යි.
   - 1.5. ලකුණු 02 යි.
   - 1.6. ලකුණු 02 යි.
   - 1.7. ලකුණු 02 යි.
   - 1.8. ලකුණු 02 යි.
   - 1.9. ලකුණු 02 යි.
   - 1.10 ලකුණු 02 යි.

   මුළු ලකුණු 20 යි.

2. ප්‍රශ්නය
   - 2.1. ලකුණු 04 යි.
   - 2.2. ලකුණු 08 යි.
   - 2.3. ලකුණු 08 යි.

   මුළු ලකුණු 20 යි.

3. ප්‍රශ්නය.
   - 3.1. ලකුණු 06 යි.
   - 3.2. ලකුණු 06 යි.
   - 3.3. ලකුණු 08 යි.

   මුළු ලකුණු 20 යි.

4. ප්‍රශ්නය.
   - 4.1. ලකුණු 08 යි.
   - 4.2. ලකුණු 02 යි.
   - 4.3. ලකුණු 02 යි.
   - 4.4. ලකුණු 08 යි.

   මුළු ලකුණු 20 යි.

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

5. ප්‍රශ්නය.
    5.1. ලකුණු 04 යි.
    5.2. ලකුණු 06 යි.
    5.3. ලකුණු 04 යි.
    5.4. ලකුණු 06 යි.

මුළු ලකුණු 20 යි.

6. ප්‍රශ්නය.
    6.1. ලකුණු 08 යි.
    6.2. ලකුණු 04 යි.
    6.3. ලකුණු 06 යි.
    6.4. ලකුණු 02 යි.

මුළු ලකුණු 20 යි.

7. ප්‍රශ්නය. ( තෝරා ගත් කොටස් 2 කට ලකුණු 10 බැගින් ලකුණු 20 කි )

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

අ.පො.ස. ( සාමාන්‍ය පෙළ විභාගය ) - 2020
සංගීතය ( පෙරදිග ) - I
අභිමතාර්ථ.

1 ශ්‍රී ලංකා ජාතික ගීයේ ආරම්භක ස්වර පාදය තෝරයි.
2 රත්නදීප ජන්ම භූමි සරල ගීතය ගැයූ ගායකයා නම් කරයි.
3 බෞද්ධ ආගමික වතාවත් හා සම්බන්ධ නොවන අවනද්ධ භාණ්ඩය තෝරයි.
4 පාසල් සංගීත අධ්‍යාපනය සඳහා සම්බන්ධ නොවන වාද්‍ය භාණ්ඩය වෙන් කොට හඳුනා ගනියි.
5 ඝන වර්ගයට අයත් වන දේශීය තාල වාද්‍ය භාණ්ඩ තෝරයි.
6 ස්වර අභ්‍යාසයේ අවරෝහණ ස්වර පිළිවෙල ගොඩ නගයි.
7 ස්වර පාදයේ ඇතුළත් ස්වර වර්ග හඳුනා ගනියි.
8 භූපාලි රාගයට අදාළ නිවැරදි ස්වර නම් කරයි.
9 ආරෝහණ, අවරෝහණ දෙකෙහි යෙදෙන ස්වර ගණන අනුව රාග ජාතිය තෝරයි.
10 භෛරවී රාගයේ ආරෝහණ ස්වර හඳුනා ගනියි.
11 යමන් රාගයේ තානාලංකාරය වෙන් කර හඳුනා ගනියි.
12 වාදි, සංවාදී ස්වර අනුව රාග නම් කරයි.
13 කාෆි රාගයේ විශේෂ ලක්ෂණයක් නම් කරයි.
14 තාල සංඥා, විභාග කිරීම්, නිවැරදිව දක්වා ඇති තාලය තෝරයි.
15 සංගීතඥයින් දෙදෙනා වාදනයට නිපුණතාවයක් දක්වන භාණ්ඩ නම් කරයි.
16 භෛරවී රාගයේ අන්තරා ආරම්භ වන ආකාරය තෝරයි.
17 යමන් රාගයට අයත් මධ්‍යලය ගීත තෝරයි.
18 වන්නම්වලට අයත් ගී පාද තෝරයි.
19 ප්‍රශස්ති හා වන්නම් අතර සමානතා දක්වයි.
20 කෙළි ගී පාදය තෝරයි.
21 මහනුවර යුගයේ ප්‍රචලිත ගීත වෙන්කර දක්වයි.
22 ගී පාදයේ, ලඝු, ගුරු, සහ ප්ලුත අක්ෂර සංඛ්‍යාව නිවැරදිව ගණනය කරයි.
23 මනමේ සහ කාලගෝල නාට්‍ය දෙකට අයත් ගීත වෙන්කොට දක්වයි.
24 නාඩගම්, නූර්ති, රංග සම්ප්‍රදායන්ට අයත් අවනද්ධ භාණ්ඩ නම් කරයි.
25 රාජකපුරු නාට්‍යයට අයත් ගීතය තෝරයි.
26 නූර්ති, නාඩගම් සඳහා තනු සැපයූ සංගීතඥයින් නම් කරයි.
27 ආනන්ද සමරකෝන් නිර්මාණය කළ ගීතය තෝරයි.
28 ශ්‍රී ලංකාවේ ජන සංගීතයේ උන්නතියට දායකවූ සංගීතඥයින් නම් කරයි.
29 මව්ගුණ තේමා කර ගත් සරල ගීතයක් නිර්මාණය කළ සංගීතඥයා නම් කරයි.
30 ස්වාධීන තනු ඇතුළත් ප්‍රථම සිංහල චිත්‍රපටය තෝරයි.
31 දෙන ලද චිත්‍රපටවලට අදාළ ගීත තෝරයි.
32 ''බෛජු බව්රා'' ''චිත්‍රපටියේ තූ ගංගා කි මෞජ් මෛ'' ගීතය නිර්මාණයට පාදක වී ඇති රාගය නම් කරයි.
33 සංගීත ප්‍රායෝගික කොටස් අධ්‍යයනය කිරිමට සුදුසු වෙබ් අඩවියක් නම් කරයි.
34 විපුලතාවයට භාවිත කරන වෙනත් නමක් තෝරයි.
35 සඩ්ජය සහ ශුද්ධ රිෂභය අතර ඇති හඬ පරතරය, බටහිර සංගීත ක්‍රමය අනුව නම් කරයි.
36 එක් එක් සංගීත භාණ්ඩවල නාදමාලා වෙන වෙනම පටිගත කිරීමට යොදා ගන්නා මෘදුකාංගය තෝරා ගනියි.
37 පෙරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයට අයත්වන සංගීත භාණ්ඩ පිළිවෙලින් තෝරයි.
38 ආලාප, මුඛ්‍යාංගය, ගානසමය යන කරුණු අයත්වන සංගීත ශෛලිය නම් කරයි.
39 බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ දී, තාලය හැඳින්වෙන සංකේත නාමය තෝරයි.
40 'අමදියෙස් මොසාර්ට්'ගේ විශිෂ්ට නිර්මාණයක් තෝරයි.

පෙරදිග සංගීතය - i පත්‍රයේ එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ප්‍රශ්න 40 ට මුලු ලකුණු 40 කි.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. ( සාමාන්‍ය පෙළ විභාගය - 2020
## සංගීතය ( පෙරදිග ) - II
## අභිමතාර්ථ.

1. ප්‍රශ්නය

    1.1. බිලාවල් රාගයට අයත් විශේෂ ස්වර සංගතිය ලියයි.

    1.2. කාෆි රාගයේ වාදි, සංවාදී ස්වර ලියයි.

    1.3. භූපාලි රාගයට අයත්වන මේලය නම් කරයි.

    1.4. මාත්‍රා දෙක සහ තුන බැගින් බෙදෙන තාලය නම් කරයි.

    1.5. නූර්ති රංග සම්ප්‍රදායට අයත් ගීත වෙන් කොට හඳුනාගනියි.

    1.6. කණ්ඩායම් ගීත සඳහා ආභාසය ලැබී ඇති, සංගීතය හඳුනා ගනියි.

    1.7. ප්‍රශස්ති ගීත ආරම්භ වූ හා ව්‍යාප්ත වූ යුග ලියයි.

    1.8. ස්වර පිහිටන ක්‍රමය හා ස්වර ස්ථාන සමාන ව යෙදෙන සංගීත භාණ්ඩ නම්කරයි.
    1.9. ග්‍රැමපෝන් ගීත දෙක වෙන්කරයි.
    1.10 මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත දෙක වෙන්කරයි.

2. ප්‍රශ්නය

    2.1. යමන් හා බිලාවල් රාග වෙන් වෙන්ව හඳුනා ගනියි.

    2.2. මධ්‍යලය ගීතයක් හා වාදිතයක් තානාලංකාර සමග ලියයි.

    2.3. සර්ගම් ගීතයක් ස්ථායි, අන්තරා, ස්වර ප්‍රස්ථාර කරයි.

3. ප්‍රශ්නය.

    3.1. නිර්මාණ කළ ස්වර ප්‍රස්තාර කොටසට අයත් රාග පිළිවෙලින් නම් කරයි.

    3.2. ජාති ලක්ෂණය අනුව ගී පාද ප්‍රස්තාර කරයි.

    3.3. ස්වර ප්‍රස්තාර දෙකට අයත් තාල ප්‍රස්තාර කරයි.

4. ප්‍රශ්නය.

    4.1. අනාඝාතාත්මක මෙහෙගී වර්ග 04 ක් ලියයි.

    4.2. මෙහෙ ගී අනාඝාතාත්මක වීමට හේතු දක්වයි.

    4.3. ආඝාතාත්මක මෙහෙ ගී වර්ග 02 ක් ලියයි.

    4.4. මෙහෙ ගීයක් තෝරාගෙන ගීත ස්වර ප්‍රස්තාර කරයි.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

5. ප්‍රශ්නය.

5.1. රූප සටහනේ දැක්වෙන වාද්‍ය භාණ්ඩ නම් කරයි.

5.2. තෝරාගත් වාද්‍ය භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ කොටස් නම් කරයි.

5.3. • තෝරාගත් භාණ්ඩයේ ස්වර අෂ්ඨකය ඇඳ පෙන්වයි.

• තබ්ලාවේ රූප සටහනක් ඇඳ අවනද්ධාක්ෂර නිකුත්වන ස්ථාන ලකුණු කරයි.

5.4. තෝරාගත් භාණ්ඩය වාදනයට පෙර සැලකිල්ලට ගත යුතු කරුණු පැහැදිලි කරයි.

6. ප්‍රශ්නය.

6.1. අපරදිග ස්වර ප්‍රස්තාරයේ දක්වා ඇති සංකේත නම් කරයි.

6.2. ස්වර ප්‍රස්තාරය අයත්වන ස්කේලයේ නම ලියා, ස්කේලයට අයත්වන ස්වර ලියා දක්වයි.

6.3. ප්‍රස්තාර කොටසේ ඇතුළත් වරණය වරහන් තුළින් තෝරා දක්වයි.

7. ප්‍රශ්නය.

7.1. නව නාට්‍ය, චිත්‍රපට ගීත, මව්පිය ගුණ වර්ණනා කර ගත් සරල ගීතවලින් කැමති ගීතයක් තෝරා ගෙන අදහස් දක්වයි.

7.2. පරිගණකය සංගීත නිර්මාණයට අධ්‍යාපනයට ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරයි.

7.3. පාසල් විවිධ ප්‍රසංගයෙන් තමා ලද අත් දැකීම් හා කුසලතා කෙටියෙන් ලියා දක්වයි.

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

**සංගීතය (පෙරදිග) I, II**
சங்கீதம் (கீழைத்தேய) I, II
**Music (Oriental) I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සංගීතය (පෙරදිග) I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශ්‍රී ලංකා ජාතික ගීතය ආරම්භ වන ස්වර පාදය තෝරන්න.

(1) | ස – ස – | ග – ස ග | ප – ග ප | ස්̇ – ස්̇ – |
(2) | ග ග ප ප | ග රි ස – | ග ම ප ස්̇ | නි ධ ප – |
(3) | ස ස ම ම | ග ග ම ම | ස ස ම ම | ග ග ම ම |
(4) | ග – ග – | රි – නි̣ රි | ස – – – | – – ස නි̣ |

**2.** "රත්න දීප ජන්ම භූමි - ලංකාදීප විජය භූමි" යන ප්‍රචලිත සරල ගීතයේ ගායකයා කවුරුන් ද?

(1) ඩබ්ලිව්.ඩී. අමරදේව (2) සුනිල් ශාන්ත (3) එච්.ආර්. ජෝතිපාල (4) සුනිල් එදිරිසිංහ

**3.** බෞද්ධ ආගමික වතාවත් හා සම්බන්ධ **නොවන** අවනද්ධ වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(1) ගැටබෙරය (2) අත් රබාන (3) තම්මැට්ටම (4) දවුල

**4.** පාසල් සංගීත අධ්‍යාපනයේ දී බහුල වශයෙන් යොදා ගනු ලබන ස්වර පුවරු භාණ්ඩය වන්නේ,

(1) එකෝඩියන් ය. (2) විද්‍යුත් ඕගනය ය. (3) සර්පිනාව ය. (4) මෙලෝඩිකාව ය.

**5.** දේශීය සංගීත භාණ්ඩ අතුරෙන්, ඝන වර්ගයට අයත් වන තාල වාද්‍ය භාණ්ඩ දෙකක් ඇතුළත් වරණය කුමක් ද?

(1) ගෙජ්ජි සහ රබාන (2) තාලම්පොට සහ පන්තේරුව
(3) සිම්බල් සහ දඬුබෙරය (4) රබාන සහ තාලම්පොට

**6.** සගරි, රිමග, ගපම යන ස්වර අභ්‍යාසයේ අවරෝහණ ස්වර පිළිවෙළ ගොඩනැගෙන්නේ,

(1) ස්̇ නි ධ, නි ධ ප, ධ ප ම වශයෙනි.
(2) ස්̇ ධ නි, නි ප ධ, ධ ම ප වශයෙනි.
(3) ධ ස්̇ නි, ප නි ධ, ම ධ ප වශයෙනි.
(4) ධ නි ස්̇, ප ධ නි, ම ප ධ වශයෙනි.

**7.** | ග රි ස – | නි̣ රි ස – | ප ම' ග රි | ග – – – | යන ස්වර පාදයේ

(1) මධ්‍ය ස්වරයක්, විකෘති ස්වරයක් සහ උච්ච ස්වර ඇතුළත් ය.
(2) මන්ද්‍ර ස්වරයක්, කෝමල ස්වරයක් සහ විකෘති ස්වර ඇතුළත් ය.
(3) මන්ද්‍ර ස්වරයක්, විකෘති ස්වරයක් සහ ශුද්ධ ස්වර ඇතුළත් ය.
(4) මන්ද්‍ර ස්වරයක්, කෝමල ස්වරයක් සහ මධ්‍ය ස්වර ඇතුළත් ය.

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**8.** භූපාලි රාගයට අදාළ ස්වර නිවැරදි ව ඇතුළත් වරණය කුමක් ද?

(1) ස ග ම ප ධ (2) ස රි ග ප ධ (3) ස රි ම ප ධ (4) ස ග ප ධ නි

**9.** ආරෝහණයේ ස්වර හයක් සහ අවරෝහණයේ ස්වර හතක් යෙදෙන රාගයකට අයත් රාග ජාතිය තෝරන්න.

(1) ඖඩව-ෂාඩව (2) ෂාඩව-සම්පූර්ණ
(3) ඖඩව-සම්පූර්ණ (4) සම්පූර්ණ-ෂාඩව

**10.** භෛරවී රාගයට අදාළ ආරෝහණ ස්වර නිවැරදි ව ඇතුළත් වරණය කුමක් ද?

(1) ස රි ග ම ප ධ නි ස̇ (2) ස රි ග ම' ප ධ නි ස̇
(3) ස රි ග̲ ම ප ධ නි̲ ස̇ (4) ස රි̲ ග̲ ම ප ධ̲ නි̲ ස̇

**11.** |ගරි නිධ නිරි ගරි | ග– ගරි නිරි ස– | යන ස්වර සමූහය

(1) බිලාවල් රාගයට අයත් තානාලංකාරයකි.
(2) යමන් රාගයට අයත් ආලාප කොටසකි.
(3) බිලාවල් රාගයට අයත් සර්ගම් කොටසකි.
(4) යමන් රාගයට අයත් තානාලංකාරයකි.

**12.** ග, ධ සහ ධ, ග යන ස්වර, වාදි සංවාදි වශයෙන් පිළිවෙළින් යෙදෙන රාග යුගලය වන්නේ,

(1) භූපාලි සහ බිලාවල් ය. (2) බිලාවල් සහ භූපාලි ය.
(3) භූපාලි සහ යමන් ය. (4) යමන් සහ භූපාලි ය.

**13.** කාෆි රාගයට අදාළ විශේෂ ලක්ෂණයක් ඇතුළත් වරණය කුමක් ද?

(1) ගාන සමය දිවා ප්‍රථම ප්‍රහරය වීම
(2) ඖඩව ජාති රාගයක් වීම
(3) ප, ස ස්වර වාදි, සංවාදි වීම
(4) කෝමල ස්වර හතරම යෙදීම

**14.** තාල සංඥා සහ විභාග කිරීම නිවැරදි ව දක්වා ඇත්තේ කුමන වරණයෙහි ද?

(1)

| | | | |
|---|---|---|---|
| ධා ධිං ධිං ධා | ධා ධිං ධිං ධා | ධා තිං තිං තා | තා ධිං ධිං ධා |
| x | 2 | 0 | 3 |

(2)

| | | | |
|---|---|---|---|
| ධගෙ | නති | නක | ධින |
| x | 0 | 2 | 3 |

(3)

| | | | |
|---|---|---|---|
| ධී නා ධී | ධී නා | තී නා ධී | ධී නා |
| x | 2 | 0 | 3 |

(4)

| | |
|---|---|
| ධා ධී නා | ධා තූ නා |
| 0 | x |

**15.** උස්තාද් ශකීර් හුසේන් සහ පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා, වාදනයට පරිපූර්ණත්වයක් දක්වන භාණ්ඩ යුගලය පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) වයලීනය සහ එස්රාජය (2) සන්තූරය සහ දිල්රුබාව
(3) සිතාරය සහ සරෝදය (4) තබ්ලාව සහ බටනලාව

**16.** |ධ̲ ම ධ̲ නි̲ | ස̇ – රි̲̇ ස̇ | යනුවෙන් අන්තරා කොටස ආරම්භ වන රාගය කුමක් ද?

(1) භෛරවී රාගය (2) භූපාලි රාගය
(3) කාෆි රාගය (4) බිලාවල් රාගය

**17.** සදා කල් වඳිම් මා, දිනිඳා අවරේ, තරු කැට මෝරන, පියා කී නජරියා, ගුරු බින කෛසේ, යන සිංහල සහ හින්දි ගීත අයත් වන්නේ,

(1) බිලාවල් රාගයට ය. (2) කාෆි රාගයට ය.
(3) භූපාලි රාගයට ය. (4) යමන් රාගයට ය.

Department of Examinations - Sri Lanka

- අංක **18** සිට **21** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.

A - ලක්ෂ්මී බුජ වාසා
B - නොමදින් විකුම් පාලා
C - මෝරා බීජයෙනා
D - සේවිත පාද සරෝරුහ
E - දොඩම් කපාලා ඇඹුල් තනාලා

**18.** මෙරට වන්නම්වලට අයත් ගී පාද වන්නේ,
(1) A සහ B ය. (2) B සහ C ය. (3) C සහ D ය. (4) D සහ E ය.

**19.** ගී තනුවල ආරම්භක පාද අතර සමාන බවක් දක්නට ලැබෙන ගී පාද යුගලය තෝරන්න.
(1) A සහ C (2) A සහ D (3) B සහ D (4) C සහ E

**20.** කෙළි ගී හා සම්බන්ධ වන ගී පාදය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**21.** මහනුවර යුගයේ දී ප්‍රචලිත වූ ගීත විශේෂයන්ට අදාළ ගී පාද තුනක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A B C (2) A D E (3) B C D (4) C D E

**22.** "රන් රන් කුරුළු ජෝඩු පියඹා යනවා" මෙම ගී පාදයේ ලඝු, ගුරු සහ ප්ලුත අක්ෂර සංඛ්‍යාවන් නිවැරදි ව දැක් වූ වරණය කුමක් ද?
(1) ලඝු 8, ගුරු 5, ප්ලුත 3
(2) ලඝු 4, ගුරු 6, ප්ලුත 2
(3) ලඝු 3, ගුරු 8, ප්ලුත 2
(4) ලඝු 8, ගුරු 3, ප්ලුත 2

**23.** "ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ" හා "ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්" යන ගීත ඇතුළත් නාට්‍ය යුගලය පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
(1) මනමේ සහ සිංහබාහු
(2) මනමේ සහ කාලගෝල
(3) සිංහබාහු සහ කාලගෝල
(4) කාලගෝල සහ මනමේ

**24.** නාඩගම් සහ නූර්ති යන රංග සම්ප්‍රදායන් සඳහා යොදා ගනු ලබන අවනද්ධ වාද්‍ය භාණ්ඩ යුගලය දැක්වෙන වරණය කුමක් ද?
(1) මද්දලය සහ තබ්ලාව
(2) මෘදංගය සහ දෙමළ බෙරය
(3) මද්දලය සහ පඛාවාජය
(4) දවුල සහ උඩැක්කිය

**25.** නාට්‍යයේ නම හා ඊට අදාළ ගීතය නිවැරදි ව ඇතුළත් වරණය කුමක් ද?
(1) රාජකපුරු – සුවඳ සබන් ඇඟ ගාලා
(2) තාරාවෝ ඉගිලෙති – පළමුව මම වැන්ද බුදුන්
(3) මධුර ජවනිකා – සෝබාව දේ මෙපුර
(4) අබුද්දස්ස කෝලම – රතදර සිරි පරදන නිමල කොමල

**26.** නූර්ති සහ නාඩගම් රංග සම්ප්‍රදායන් සඳහා තනු සැපයූ සංගීතඥයින් දෙදෙනෙක් පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) අලගනායිදු සහ ගණිතාලංකාර
(2) අබ්දුල් සතාර් සහ ජයාශංකර්
(3) අලගනායිදු සහ නාරසිංහ
(4) විශ්වනාත් ලව්ජී සහ අලගනායිදු

**27.** ආනන්ද සමරකෝන් විසින් නිර්මාණය කරන ලද මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීතයක් දැක්වෙන වරණය කුමක් ද?
(1) දිය ගොඩ සැම තැන කිරි ඉතිරේ
(2) පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
(3) මව්පියො ආදී සොඳුරු තමාගේ
(4) දස බලධාරී විදුරසුනේ හිඳ

**28.** ශ්‍රී ලංකාවේ ජන සංගීතය පිළිබඳ පෘථුල ලෙස පර්යේෂණ කරමින් එහි උන්නතියට දායක වූ සංගීතඥයින් දෙදෙනෙකු ඇතුළත් වරණය කුමක් ද?
(1) ඩබ්ලිව්.ඩී. අමරදේව, නන්දා මාලිනී
(2) ටී.එම් ජයරත්න, ලයනල් රන්වල
(3) රෝහණ බැද්දගේ, වික්ටර් රත්නායක
(4) ඩබ්ලිව්.බී. මකුලොලුව, සී.ද.එස්. කුලතිලක

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**29.** මව් ගුණ තේමා කරගත් සරල ගීතයක් සහ එම ගීතය හා සම්බන්ධ සංගීතවේදියාගේ නම නිවැරදි ව ඇතුළත් වරණය කුමක් ද?

(1) අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී – ටී.එම් ජයරත්න
(2) ගමට කලින් හිරු මුළු තැන් ගෙට වඩනා – සුනිල් දයානන්ද කෝනාර
(3) අන්දරයාගේ වැව් තාවල්ලේ – කරුණාරත්න දිවුල්ගනේ
(4) දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා – නන්දා මාලිනී

**30.** ස්වාධීන ගී තනු නිර්මාණ ඇතුළත් ප්‍රථම සිංහල චිත්‍රපටය කුමක් ද?

(1) ගැටවරයෝ (2) සැඩසුළං (3) රේඛාව (4) සත් සමුදුර

**31.** "ආරිච්චි බෝරිච්චි" හා "පිපී පිපී රේණු නටන" මෙම ගීත ඇතුළත් චිත්‍රපට පිළිවෙළින් සඳහන් වන වරණය කුමක් ද?

(1) සැඩසුළං සහ රන්මුතු දූව
(2) ගැටවරයෝ සහ රන්මුතු දූව
(3) සත් සමුදුර සහ ගැටවරයෝ
(4) සැඩසුළං සහ සත් සමුදුර

**32.** බෛජු බව්රා චිත්‍රපටයේ ගැයෙන "තූ ගංගා කී මෞජ් මෙ" ගීතය නිර්මාණය වී ඇති රාගය කුමක් ද?

(1) බිලාවල් රාගය
(2) කාෆි රාගය
(3) භෛරවී රාගය
(4) යමන් රාගය

**33.** සංගීතය පිළිබඳ ප්‍රායෝගික කොටස් අන්තර්ජාලය තුළින් අධ්‍යයනය කිරීම සඳහා යොදා ගත හැකි වෙබ් අඩවිය කුමක් ද?

(1) Windows
(2) Youtube
(3) Multi-track
(4) VST-plugins

**34.** තාරතාවය, විපුලතාවය, ධ්වනි ගුණය යන නාදයේ ත්‍රිවිධ ගුණයන් අතුරෙන් විපුලතාවය හැඳින්වීම සඳහා භාවිත තවත් නාමයක් වන්නේ,

(1) උච්ච නීච භේදයයි.
(2) ජාති භේදයයි.
(3) රූප භේදයයි.
(4) නාද ප්‍රභේදයයි.

**35.** ෂඩ්ජය සහ ශුද්ධ රිෂභය යන ස්වර අතර ඇති හඬ පරතරය බටහිර සංගීත ක්‍රමයට අනුව හඳුන්වනු ලබන්නේ,

(1) Micro tone යනුවෙනි.
(2) Demi-semi tone යනුවෙනි.
(3) Tone යනුවෙනි.
(4) Semi-tone යනුවෙනි.

**36.** පරිගණකය මගින් එක් එක් සංගීත භාණ්ඩවල නාදමාලා වෙන වෙනම පටිගත කරගැනීම සඳහා යොදා ගත හැකි මෘදුකාංගය කුමක් ද?

(1) Cubase (2) Indesign (3) Page maker (4) Photoshop

**37.** ඝන, සුෂිර, තත්, අවනද්ධ යන භාණ්ඩ වර්ගීකරණය යටතේ පිළිවෙළින් සංගීත භාණ්ඩ සඳහන් වන වරණය කුමක් ද?

(1) තබ්ලාව, ජල තරංග, බටනලාව, සිතාරය
(2) ජලතරංග, තබ්ලාව, සිතාරය, බටනලාව
(3) බටනලාව, සිතාරය, තබ්ලාව, ජලතරංග
(4) ජලතරංග, බටනලාව, සිතාරය, තබ්ලාව

**38.** ආලාප, මුඛ්‍යාංග, ගානසමය යනාදි කරුණු අයත් වන සංගීත ශෛලිය කුමක් ද?

(1) බටහිර සංගීතය
(2) ජන සංගීතය
(3) රාගධාරී සංගීතය
(4) සරල සංගීතය

**39.** බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ දී තාලය දැක්වෙන සංකේතය හැඳින්වෙන නාමය කුමක් ද?

(1) Treble clef (2) Sign to sign (3) Time signature (4) Repetition mark

**40.** "අමදියෙස් මොසාර්ට්" නම් අපරදිග සම්භවයක් ඇති සංගීතඥයාගේ විශිෂ්ට නිර්මාණයක් වන්නේ,

(1) එරොයිකා සිම්ෆනි ය.
(2) පැස්ටරෝල් සිම්ෆනි ය.
(3) ජුපිටර් සිම්ෆනි ය.
(4) කෝරල් සිම්ෆනි ය.

* *

Department of Examinations - Sri Lanka

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2020

විෂය අංකය / பாட இலக்கம்: **40**

විෂයය / பாடம்: **සංගීතය (පෙරදිග)**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 4 | 21. | 1 | 31. | 2 |
| 02. | 1 | 12. | 1 | 22. | 4 | 32. | 3 |
| 03. | 2 | 13. | 3 | 23. | 2 | 33. | 2 |
| 04. | 3 | 14. | 1 | 24. | 1 | 34. | 3 |
| 05. | 2 | 15. | 4 | 25. | 1 | 35. | 3 |
| 06. | 2 | 16. | 1 | 26. | 4 | 36. | 1 |
| 07. | 3 | 17. | 4 | 27. | 2 | 37. | 4 |
| 08. | 2 | 18. | 3 | 28. | 4 | 38. | 3 |
| 09. | 2 | 19. | 1 | 29. | 2 | 39. | 3 |
| 10. | 4 | 20. | 4 | 30. | 3 | 40. | 3 |

Department of Examinations - Sri Lanka

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020
## සංගීතය (පෙරදිග) - II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

සංගීතය (පෙරදිග) I, II
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

**සංගීතය (පෙරදිග) II**

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 20 බැගින් හිමි වේ.

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) "සපිරුණු රතියේ සුගැයෙන උදයේ" යනු නිර්දේශිත රාගයකට අයත් ලක්ෂණ ගීතයක මුල් පාදයයි. මෙම ගීතයේ අන්තරා කොටස ඇරඹෙන, රාගයට අයත් විශේෂ ස්වර සංගතිය ලියන්න.

(ii) "සසරිරි | ගුගුමම | ප – – ම | පධනිස් | " යනුවෙන් ස්වර යෙදෙන රාගයේ වාදි ස්වරය සහ සංවාදි ස්වරය ලියන්න.

(iii) සරිගපධස් යනුවෙන් ආරෝහණය ගොඩනැගෙන රාගය අයත් වන මේලය නම් කරන්න.

(iv) "සි රි | සා – ර | හෙ ළ | දී – ප | " මෙම ගී පාදය ප්‍රස්තාර කර ඇති හින්දුස්තානි තාලය නම් කරන්න.

● අංක (v) සිට (viii) තෙක් හිස් තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) 'වාසනා දිනේකි මේක', 'දැක්කොත් පද්මාවතී', 'ආරණ්‍ය ඉන්නා' යන ගීත අයත් වන රංග සම්ප්‍රදාය ........................ නමින් හැඳින්වේ.

(vi) වසර 1964 පමණ සිට මෙරට ගීත රසිකයින් අතර ජනප්‍රියත්වයට පත්, කණ්ඩායම් ගීත සඳහා ආභාසය ලැබී ඇත්තේ, .................................. සංගීතයෙනි.

(vii) මෙරට සංගීත ක්ෂේත්‍රය තුළ 'ප්‍රශස්ති ගී' ආරම්භ වූයේ කෝට්ටේ යුගයේ දී වුවත්, එම ගී වර්ධනය වී ව්‍යාප්ත වූයේ .......................... යුගයේ දී ය.

(viii) සිතාරයේ, දිල්රුබාවේ සහ ........................ ස්වර පිහිටන ක්‍රමය හා ස්වර ස්ථාන එකිනෙකට සමාන ය.

● අංක (ix) සහ (x) ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුරු, පහත වරහන් තුළ සඳහන් ගී පාදවලින් තෝරා ලියන්න.

(මව්පිය ආදී සොඳුරු තමාගේ, එන්ඩ ද මැණිකේ මමත් දියඹටා, ඕලු පිපීලා වෙල ලෙල දෙනවා, මුනි නන්දන සිරි පාද වඳිමි, මුහුදු පතුල යට ඉඳලා)

(ix) ග්‍රැමෆෝන් ගීත **දෙකක්** නම් කරන්න.

(x) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02×10=20යි)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## ලකුණු දීමේ පටිපාටිය

## සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ප්‍රශ්න 5 ට මුලු ලකුණු 100 කි.

---

**පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**

1. අංක ( i ) සිට ( x ) දක්වා අසා ඇති ප්‍රශ්න වල කෙටි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ලකුණු 20 යි.

   ( i.) **``ග ප ධ නි ṡ**

   ( ii.) **ප ස**

   ( iii.) කල්‍යාණ/ යමන්

   ( iv.) ජප්තාල්

   ( v ) නුර්ති

   ( vi ) ස්පාඤ්ඤ

   ( vii ) මහනුවර

   ( viii ) එස්රාජ්

   ( ix ) i. මව්පිය ආදී සොඳුරු තමාගේ

   ii. මුණි නන්දන සිරි පාද වඳිමි

   ( x ) i. එන්ඩද මැණිකේ මමත් දියඹටා

   ii. ඕලු පිපීලා වෙල ලෙල දෙනවා

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**2.** පහත වගුවෙහි දැක්වෙන විස්තර ඇසුරෙන්, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රාගය | රාග විස්තරය |
|---|---|
| A | ගාන්ධාරය සහ නිෂාදය වාදි, සංවාදි වන මෙම රාගයේ ගානසමය රාත්‍රී ප්‍රථම ප්‍රහරයයි. "නිරිස–, නිරිගරිස–" යන ස්වර සංගති යෙදේ. |
| B | ශුද්ධ ස්වර සියල්ල යෙදෙන මෙම රාගයේ "ගපධනිසං, මගමරිස" යන ස්වර සංගති විශේෂයෙන් යෙදේ. ධෛවතය හා ගාන්ධාරය වාදි, සංවාදි වේ. |

(i) ඉහත දැක්වෙන රාග විස්තර අනුව A සහ B රාග නම් කරන්න. (ලකුණු 04යි)

(ii) ඉහත සඳහන් රාග දෙකෙන් **එක්** රාගයක් තෝරා ගෙන ඊට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. **නැතහොත්** එම රාගයට අයත් වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර මාත්‍රා අටකට **නො අඩු** තානාලංකාර **දෙකක්** තාලානුකූල ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 08යි)

(iii) ඉහත (ii) කොටසට තෝරා **නො ගත්** රාගයට අයත් සර්ගම් ගීතයක් ස්ථායි අන්තරා වශයෙන් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08යි)

(i) A - යමන් රාගය

**B** - බිලාවල් රාගය 2x2= ලකුණු 04

(ii) යමන් හෝ බිලාවල් රාග දෙකෙන් එකක් මධ්‍යලය ඛ්‍යාල් ගීතක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාරය.

නැතහොත්

වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තර කොට තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කිරීම. ලකුණු 08

(මධ්‍යලය ගීතයේ ස්වර ප්‍රස්තාරය සඳහා ලකුණු 06 ක් ද, පද ප්‍රස්තාරයට ලකුණු 02 ක් ද වශයෙන් වෙන්කර ගත හැකිය. පදමාලාව නිවැරදිව ප්‍රස්තාර කළ අදාල රාගයට අයත් මධ්‍යලය ගීතයක සෑම තැනකම නිවැරදිව ස්වර සංඥා යොදා නොමැති නම් මුලු ලකුණු 02 කි. ඉදහිට ස්වර සංඥා ලකුණු කිරීම අමතක කර ඇත්නම් උපරිම ලකුණු 04 කි. කිසිම ස්වර ප්‍රස්තාර කොටසක් නොමැතිව පද පමණක් ප්‍රස්තාර කළ පිළිතුරකට ලකුණු හිමි නොවේ.වාදිතයක් ලෙස ස්වර පමණක් ප්‍රස්තාර කර ඇත්නම් තානාලංකාර දෙකක් ද තාලානුකූලව ප්‍රස්තාර කර දැක්වීමෙන් මුලු ලකුණු 08 ක් හිමි වේ. (වාදිතයට ලකුණු 06 යි. තානාලංකාර දෙකට ලකුණු 02 යි.) ( තානාලංකාර තාලානුකූල නොවේ නම් ලකුණු 01 ක් අහිමි වේ. රාගයට අදාල ස්වර ප්‍රස්තාරයේ හා තානාලංකාර දෙකේ සෑම තැනකම ස්වර සංඥා යොදා නැත්නම් උපරිම ලකුණු 02 කි.)

(iii) II කොටස තෝරා නොගත් රාගයට අයත් සර්ගම් ගීතයක ස්ථායි අන්තරා වශයෙන් ප්‍රස්තාර කිරීම. ලකුණු 08

Department of Examinations - Sri Lanka


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

3. නිර්දේශිත රාග ඇසුරෙන් නිර්මාණය වූ ස්වර ප්‍රස්තාර තුනක් A, B, C යටතෙහි පහත දැක්වේ.

A – | ස ධ | ප ප ධ | ම ප | ග ම – |
| ස ස | රි ග ම | ග – | රි ස – |

B – | ස් – ධ ප | ග රි ස රි | ග – ග රි | ග ධ ප – |
| ග ප ධ ස් | රි් ස් ධ ප | ග ප ධ ප | ග රි ස – |

C – | ම ප ස් | නි ධ ප | රි ග ම | ප – – |
| ම ප නි | ධ ම ප | ග ග රි | ස – – |

(i) ඉහත A, B, C ප්‍රස්තාර කොටස් අයත් වන රාග පිළිවෙළින් අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම් කරන්න. (ලකුණු 06යි)

(ii) පහත දැක්වෙන ගී පාදවල පැහැදිලි ව පෙනෙන ජාති ලක්ෂණ අනුව එම ගී පාද ඉහත A, B, C ස්වර ප්‍රස්තාර කොටස් අයත් තාල හා ගැළපේ. එම තාලයන්ට ගැළපෙන පරිදි A, B, C හි ස්වර ප්‍රස්තාර අනුව ගී පාද තෝරා, **ගීත ස්වර ප්‍රස්තාර ලෙස** නැවත ප්‍රස්තාර කර දක්වන්න.

- සුළඟ හමයි දස අතේ - ගතට සිතට සුව දැනේ
- මව්තුමනි ඔබ දෙපා - වඳිමි බැති ගී ගයා
- ජාතික හෙළ අභිමානය පතුරා - නංවමු රට දැය දිරියෙන් සපුරා (ලකුණු 06යි)

(iii) A, B, C ස්වර ප්‍රස්තාර කොටස්වලට අදාළ තාල අතුරෙන් **දෙකක්** නම් කර, එම තාල දෙකට අයත් යේකා නියමිත මාත්‍රා විභාග, තාල සංඥා සහිත ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 08යි)

(i) A - භෛරවී රාගය
B - භූපාලි රාගය
C - කාෆි රාගය 2x3= ලකුණු 06

(ii) A , 3 ? w w 3 ? q w ? ; q = ?
qa වි ? තු ම නි ? ඔ බෙ ? දෙ පා s ?
, , ? . ; ම ? ; - ? . ස =?
ව ඳි ? ï බැ ති ? ගී s ? / යා s ?

B t = e w ? / . , . ? / = / . ? /
e w = ?
ජා s ති ක ? හෙ ළ අ භි ? මා s න ය ? ප තු රා s
?
/ w e t ? y t e w ? / w e w ? /
. , = ?
නං ං ව මු ? ර ට දැ ය ? දි රි යෙ න්? ස පු
රා s ?

C ම w t ? නි ධ ප ? රි ග ම ? w =
=?
සු ළ ඟ ? හ ම යි ? ද ස අ ? තේ s s ?

Department of Examinations - Sri Lanka

ම ප නි ? e ම w ? / / . ? , = =
?
ග ත ට ? සි ත ට ? සු ව දැ ? ණේ s s ?

( පැහැදිලිව පෙනෙන ජාති ලක්‍ෂණය අනුව ප්‍රස්තාර කළ හැකි වන්නේ ඉහත ආකාරයට පමණි. වෙනත් ආකාරයකට ප්‍රස්තාර තිබුණද ලකුණු හිමි නොවේ. )

2x3= ලකුණු 06

(iii) **A - ඣප්තාල්**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ධී | නා | ධී | ධී | නා | තී | නා | ධී | ධී | නා |
| X | | 2 | | | 0 | | 3 | | |

**B - ත්‍රිතාලය**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| X | | | | 2 | | | | 0 | | | | 3 | | | |

**කෙහෙර්වා**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|
| ධ | ගෙ | න | ති | න | ක | ධී | න |
| X | | | | 0 | | | |

ඉහත තාල පද වලින් දෙකක් ප්‍රස්තාර කිරීමට 4x2= ලකුණු 08

(විභාග කිරීම හෝ තාල සංඥා නිවැරදි නොවේ නම් හෝ ලකුණු 01 බැගින් අඩු කරන්න)

**4.** (i) අනාඝාතාත්මක මෙහෙ ගී වර්ග **හතරක්** නම් කර, ඒ එකිනෙකට ගැළපෙන ගී පාදය බැගින් ලියන්න. (ලකුණු 08යි)

(ii) ඉහත (i) හි සඳහන් කළ මෙහෙ ගී අනාඝාතාත්මක වීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)

(iii) ආඝාතාත්මක මෙහෙ ගී වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)

(iv) ඉහත (iii) යටතේ නම් කළ **එක්** වර්ගයකට අයත් මෙහෙ ගීයක් තෝරා ගෙන ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08යි)

(i) A - ගැල්, පැල්, පාරු, පතල්, බඹර, යන ගී
යන ගී වර්ග වලින් 4 ක් නම් කිරීමට - ලකුණු 04 කි.
ගී පාදය බැගින් ලිවීමට - ලකුණු 04 කි. ලකුණු 08 යි.

(ii) A – මෙහෙ ගී අනාඝාතාත්මකවීමට හේතු 2 ක් ලිවීමට ලකුණු 02 යි.

ඇද පැද ලෙලවා ගැයීම
දීර්ඝ යති යෙදීම
ඒකලව ගායනය
කාර්යයේ ස්වභාවය
උච්ච ස්වරයෙන් ගැයීම

(iii) ආඝාතාත්මක මෙහෙ ගී ව වර්ග දෙකක් නම් කිරීමට ලකුණු 02 යි.
(ගොයම්, නෙලුම්, කමත්, දල්, කුරක්කන්, පන්නෙලීමේ ගී, )

(iv) ( ස්වර ප්‍රස්තාරයට ලකුණු 04 යි. පද ප්‍රස්තාරයට ලකුණු 04 යි. )

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

Department of Examinations - Sri Lanka

**5.** A, B, C, D යටතේ දැක්වෙන වාද්‍ය භාණ්ඩ රූපසටහන් ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.




(i) ඉහත A, B, C, D රූප සටහන්වලින් දැක්වෙන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ලකුණු 04යි)

(ii) ඉහත **එක්** වාද්‍ය භාණ්ඩයක් තෝරාගෙන එහි දළ රූප සටහනක් ඇඳ එම රූප සටහනෙහි, තෝරාගත් භාණ්ඩයට අදාළ කොටස් 6ක් නම් කරන්න. (ලකුණු 06යි)

(iii) ඉහත (ii) හි ඔබ තෝරා ගත් භාණ්ඩයේ 'ස,රි,ග,ම,ප,ධ,නි,සං' ස්වර පිහිටන අයුරු සුදුසු දළ රූප සටහනක් මගින් පෙන්වා දෙන්න. ඉහත (ii) කොටස සඳහා **ඔබ තෝරා ගෙන ඇත්තේ** 'D' අක්ෂරයට අයත් භාණ්ඩය නම් එහි අවනද්ධාක්ෂර 8ක් නිකුත් වන ස්ථාන සුදුසු රූප සටහනක් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 04යි)


(iv) ඉහත (ii) හි ඔබ තෝරා ගත් භාණ්ඩය වාදනය කිරීමට පෙර විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු කරුණු **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

A – එස්රාජය. B – ගිටාරය. C – වයලීනය. D – තබ්ලාව

(i) භාණ්ඩ නම් කිරීමට ලකුණු 04 යි.

(ii) එක් භාණ්ඩයක රූප සටහනක් ඇඳ කොටස් 6 ක් නම් කිරීමට ලකුණු 06

A සයාහී
B ලවය
C චාන්ටී
D බද්ධී
E ගජරා
F ගුඩරි
G ලකඩි



රූප සටහන 02


(iii) රූප සටහනක ස්වර ස්ථාන හෝ අවනද්ධාක්ෂර 08 ක් පෙන්වීමට ලකුණු 04 යි.

1. ග (ගෙ)
2. කත්,
3. නා (තා)
4. තිං (ති)
5. ධා
6. ධිං,
7. ති,
8. ට. යන ආදි වශයෙන්

Department of Examinations - Sri Lanka

(iv) කරුණු 03 කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 2 x 3 = 06
නිවැරදි අයුරින් සුසර කිරීම, නිවැරදි ඉරියව්, බෝ එකෙහි රෝසිං ගෑම, තබ්ලාව දරනු මත නිවැරදිව තබා ගැනීම...........................

**6.** මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීතයකින් තෝරා ගත් ගී තනු පාදයක අපරදිග ස්වර ප්‍රස්තාරය පහත දැක්වේ.




(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාර කොටසේ අංක 1 සිට 8 දක්වා සටහන් කර ඇති සංකේත නම් කරන්න. (ලකුණු 08යි)

(ii) එම අපරදිග සංගීත ප්‍රස්තාර කොටස පෙරදිග සංගීත ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කරන්න. (ලකුණු 04යි)

(iii) ඉහත ප්‍රස්තාරය අයත් ස්කේලය (Scale) නම් කර ඊට අයත් ආරෝහණ ස්වර පෙරදිග සංගීත ක්‍රමයට ලියා දක්වන්න. (ලකුණු 06යි)

(iv) එම ප්‍රස්තාර කොටස අයත් වන්නේ වරහන් තුළ ඇති ගී අතුරෙන් කුමන ගීතයට ද?
(එන්ඩ ද මැණිකේ මමත් දියඹටා, මිහි කත නළවාලා, බෝවිටියා දං පලු කං වාරේ, ඕලු පිපීලා වෙල ලෙල දෙනවා, අක්කෙ අක්කෙ අර බලන්නකෝ ) (ලකුණු 02යි)

Department of Examinations - Sri Lanka

(i) සංකේත 8 නම් කිරීමට ලකුණු 08 යි.

1. Treble Clef
2. Time Signature
3. Bar Line
4. Crotchet
5. Minim
6. Ledger Line
7. SemiBreve
8. Tie

(ii) පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කිරීමට ලකුණු 04 යි.

, = , , , = m , . . w w / =
/ =
. / q w / = . = , = = = =
= = =

(iii) ස්කේලයට අයත් ආරෝහණ ස්වර පෙරදිග ක්‍රමයට ලිවීම ලකුණු 06 යි.

, . / q w e r t

(iv) ඕලු පිපිලා වෙල ලෙලදෙනවා යන ගීතය නම් කිරීමට

ලකුණු 02 යි.

**7.** පහත සඳහන් කොටස් තුනෙන් කැමති **දෙකක්** තෝරාගෙන පිළිතුරු ලියන්න.

(i) පහත සඳහන් ගී වර්ග අතුරෙන්, කැමති ගීතයක් තෝරාගෙන, එම ගීතය පිළිබඳ ඔබේ අදහස් සුවිශේෂී කරුණු **පහක්** යටතේ කෙටියෙන් ලියන්න.

- නව නාට්‍ය ගී
- චිත්‍රපට ගී
- මව්පිය ගුණ වර්ණනා තේමා කරගත් සරල ගී

(ii) පරිගණකය, සංගීත නිර්මාණයට සහ සංගීත අධ්‍යාපනයට ප්‍රයෝජනවත් මෙවලමක් ලෙස වැදගත් වන ආකාරය කරුණු **පහක්** යටතේ පැහැදිලි කරන්න.

(iii) 'පාසලේ විවිධ ප්‍රසංගයට සහභාගි වීමෙන් මා ලද අත්දැකීම් සහ සංගීත කුසලතා' යන මාතෘකාවට අනුව අදහස් කරුණු **පහක්** යටතේ කෙටියෙන් ලියන්න.

(ලකුණු 10×2=20යි)

(i) කැමති ගීතයක් පිළිබඳ සුවිශේෂි කරුණු 05 ක් කෙටියෙන් ලිවීමට

* පදමාලාව, තනුව, රිද්මය (පෙර වාදන, අතුරු වාදන)
* ගායකයා, ගායිකාව, පද රචක
* සංගීතමය සුවිශේෂතා
* ගායනය, තේමාව
* නාට්‍ය ගීතයක් නම් අවස්ථාව
* චිත්‍රපට ගීතයක් නම් ජවනිකාව
* ගීතයෙන් සමාජයට විය හැකි යහපත

ඉහත තොරතුරු අනුව සුවිශේෂි කරුණු 05 ක් ලිවීම සෑහේ.

(ii) පරිගණකය සංගීත අධ්‍යාපනයට වැදගත් වන ආකාරය කරුණු 05 ක් යටතේ ලිවීමට

**සංගීත නිර්මාණයට**

* සංගීත පටිගත කිරීම
* සංගීත කෘති සංරක්ෂණයට
* සංගීත නිර්මාණ සංස්කරණයට
* ගායන, වාදන දෝෂ අවම කර ගැනීමට
* අවම ශිල්පීන් ගණනකගේ කාර්යය කර ගැනීමට හැකි වීම

**සංගීත අධ්‍යාපනයට**

* අන්තර්ජාල භාවිතයට
* මාර්ගගත අධ්‍යාපනය භාවිතා කිරීමට
* විවිධ වෙබ් අඩවි භාවිතා කරමින් අධ්‍යාපනයේ නියැලීමට අවස්ථාව ලැබීම
* ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණයක් ලෙස භාවිතා කිරීම
* ප්‍රායෝගික කොටස් ඉගෙනීමට යොදා ගත හැකිවීම
* විවිධ සංගීත කෘති විශ්ලේෂණය කර ශ්‍රවණය කිරීමට හැකි වීම

(iii) මාතෘකාවට අනුව කරුණු 05 ක් යටතේ කෙටියෙන් ලිවීමට

* වාදන කුසලතා/ ගායනා කුසලතා
* දෘෂ්‍ය මාධ්‍ය අනුව වාදනය කිරීම
* කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම
* අභිමානයක් ඇතිවීම
* විධානයකට අනුව කටයුතු කිරීම
* නායකත්වයට ගරු කිරීම
* ඉදිරිපත් වීමේ ශක්තිය දියුණු වීම
* ආත්ම විශ්වාසය ඇති වීම

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- * තාක්ෂණික මෙවලම් සමග කටයුතු කිරීම
- * ප්‍රේක්ෂක ප්‍රතිචාර නිසා ලැබූ සතුට

**ඉහත කොටස්වලින් 02 ක් ලිවීමට**
**ලකුණු 10 x 2 = 20 යි**

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

Department of Examinations - Sri Lanka

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/